# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2004/25 - 2017 ජනවාරි 30 වැනි සඳුදා - 2017.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ, කඳාකුල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/පීපීඑච්/2015/554 හා 2015.03.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ'ලෙස දක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0539 ක් පමණ වන නාරංකඩුව වත්ත නැමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ'– නාරංකඩුව වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0539 ක් පමණ**

උතුරට: එල්. ඒ. ඩී. කේ. ගුණතිලක හිමිකම් කියන නාරංකඩුව වත්ත සහ ඩබ්. එස්. එම්. රම්බණ්ඩා හිමිකම් කියන මුතුවා වෙදගේ ඉඩම; නැගෙනහිරට: ඩබ්. එස්. එම්. රම්බණ්ඩා හිමිකම් කියන මුතුවා වෙදගේ ඉඩම; දකුණට: පුංචිරාල වෙදරාල හිමිකම් කියන බටපඳුරේ හේන සහ පාතහේවාහැට ප්‍රාදේශීය සභාව හිමිකම් කියන නාරංකඩුව වත්ත; බටහිරට: පාතහේවාහැට ප්‍රාදේශීය සභාව හිමිකම් කියන නාරංකඩුව වත්ත සහ මාර්ගය.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/9/2015/ඩබ්ලිව්එස්/51.
2016 නොවැම්බර් මස 29 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02-598



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*